CPA

CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් මංජුල තිලකරත්න මහතාට එල්ල කරන ලද ප්‍රහාරය පිළිබඳව වූ ප්‍රකාශය

**2012 ඔක්තෝම්බර් 10 වනදා, කොළඹ, ශ්‍රී ලංකාව :** අධිකරණ සේවා කොමිසමේ ලේකම් මංජුල තිලකරත්න මහතා වෙත ඔක්තෝම්බර් 07 වන දින එල්ල කරන ලද ප්‍රහාරය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැඩි ලෙස හෙළා දකී. එසේම අප අධිකරණය මෙන්ම අනෙකුත් විසම්මුතික හඬවල් වලට එරෙහිව සිදු කරනු ලබන බිය ගැන්වීම් හා ශාරීරික ප්‍රචණ්ඩත්වයන් වහාම අවසන් කරන ලෙසද දැඩි ලෙස කියා සිටිමු. මෙම සිදුවීම පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ අධිකරණයට සහ එහි ස්වාධීනත්වයට එල්ල වූ ඍජු තර්ජනයක් වන බව සහ එයට එරෙහිව එල්ල වූ බිය ගැන්වීම් සහ ඇතැම් විට ප්‍රචණ්ඩ වූ ප්‍රහාරයන් මාලාවක අළුත්ම ජවනිකාව වන බව කිවයුතුව ඇත. පහරදීමට පසු බලධාරීන් විසින් කියා සිටියේ වරදකරුවන් කවරකු හෝ වේවා ඔවුනට එරෙහිව පියවර ගන්නා බවය. මෙය ප්‍රචණ්ඩ සිදුවීම් වලට පසු නිකුත් වන සම්මත ප්‍රතිචාරයකි. මෙවැනි බොහෝ සිදුවීම් වලදී සැබෑ අනුගමනීය ක්‍රියාමාර්ගයන් නොගැනෙන අතර බොහෝ විට වරදකරුවන් වගවීමට ලක් නොකෙරේ. අතීතයේ දී කළ පරිදිම, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඉල්ලා සිටින්නේ පූර්ණ සහ ඉක්මන් පරීක්ෂණයක් පවත්වා වරදකලවුන් යුක්තිය පසිඳලීම වෙත ගෙන ඒමට ක්‍රියාමාර්ග ගන්නා ලෙසය. දඬුවම් නොලබා වරද කිරීමේ සංස්කෘතිය අවසන් විය යුතුමය.

අධිකරණය සහ එ හි නිලධාරීන් ඉලක්ක කර ගනිමින් මෑත දිනවලදී සිදුවූ සිද්ධීන් රාශිය නිසා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැලඹීමට පත්ව තිබිණි. අධිකරණ සේවා කොමිශන් සභාව විසින් මින්පෙර සිදුනොවූ ආකාරයට පුවත්පත් නිවේදනයක් නිකුත් කරමින් අධිකරණයෙහි ස්වාධීනත්වය අනතුරක පවත්නා බව කියා සිටියේය. ඉන්පසු සැප්තැම්බර් 27 වන දින පුවත්පත් කලාවේදීන් සමග පැවති රැස්වීමකදී ජනාධිපති වරයා විසින්ම ද එම කාලය තුළ වෙනත් අය විසින්ද තිලකරත්න මහතා ප්‍රසිද්ධියේ දෝශ දර්ශණයට ලක් කරනු ලැබිණි. අධිකරණ සේවා කොමිසමේ සාමාජිකයන් හා ඔවුන්ගේ පවුල්වල අයගේ ආරක්ෂාවට තර්ජනයන් පවතින බව ඔහු විසින් මාධ්‍යයන් හී අවධානයට ලක්කල අතර එමගින් ප්‍රචණ්ඩ ක්‍රියාවන් සිදුවනු ඇති බවට අනාවැකි පළකිරීමක් ඔහු විසින් වඩාත් මෑත කාලයේදී සිදුකරනු ලැබිණි.

එබැවින් මෙය හුදකලා සිදුවීමක් සේ නොසැලකිය යුතුය. අධිකරණය වෙත එල්ල වූ ප්‍රහාරයන් රජයේ සියලු විවේචකයන් බිය ගැන්වීමට හා නිශ්ශබ්ද කිරීමට ගන්නා ක්‍රමානුකූල උත්සාහයක කූටප්‍රාප්තියක් වන බව කිවයුතු වේ. අපගේ ප්‍රජාතන්ත්‍රවාදය පමණක් නොව ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදයක් රඳා පවත්නා මූලික පූර්ව කොන්දේසීන් වන නීතියේ ආධිපත්‍යය සහ අධිකරණයේ ස්වාධීනත්වය බරපතල අනතුරක පවත්නා බව එමගින් වැඩිදුරටත් පෙන්නුම් කෙරේ. නීතියේ ආධිපත්‍යයෙහි හා ස්වාධීන ආයතනයන් හී ක්‍රමානුකූල බිඳවැටීම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් නිරතුරුවම ඉස්මතුකොට දක්වා තිබේ. එමෙන්ම ඊට තුඩුදුන් දහ අට වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඇතුළු එබඳු පියවරයන් ද අප විසින් අභියෝගයට ලක් කර තිබේ. මෙම අනතුරුදායක ප්‍රවණතාවය වහාම පාලනය කොට නැවැත්වීමටත්, අප රටේ ක්‍රියාත්මක ප්‍රජාතන්ත්‍රයක මූලික සාධකයන් සුරකින බවට රජය විසින් දී ඇති පොරොන්දුවලට අනුකූලව ක්‍රියා කිරීමටත්, අධිකාරීන් විසින් පියවර ගැනීම අතිශය වැදගත්කමකින් යුක්ත වූවකි.

###

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) පිහිටුවනු ලැබුයේ ශ්‍රී ලංකාවේ ගැටුම් පරිවර්තනය හා යහපාලනය සඳහා ආයතනයන් ශක්තිමත් කිරීමේ හා හැකියා වර්ධනයේ හදිසි අවශ්‍යතාවයක් පවතින බවට හා පක්ෂවාදී නොවන සිවිල් සමාජ කණ්ඩායම් විසින් මෙම ක්‍රියාදාමය වෙත ඉටුකළ යුතුවූ වැදගත් සහ නිර්මාණශීලී දායකත්වයක් පවතින බවට වූ දැඩි විශ්වාසය පෙරදැරි කොටගෙනයි රාජ්‍ය ප්‍රතිපත්ති විෂයයයෙහිදී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙතින් බලාපොරොත්තු වන්නාවූ ප්‍රධාන භූමිකාව පූර්වක්‍රියාකාරී හා මැදිහත්කාරක එකක් වන අතර හිංසාවෙන් තොරවූ ගැටුම් නිරාකරණය හා ප්‍රජාතන්ත්‍රික රාජ්‍යකරණය සඳහා වූ ප්‍රතිපත්ති විකල්පයන් ව්‍යාප්ත කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා බලපෑම් කිරීම ඉලක්ක කොට ගත්තක් වෙයි ඒ අනුව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කාර්යයන් හට, බලපෑම් කරනු ලබන ප්‍රතිපත්ති විකල්පයන් හඳුනාගන්නාවූ හා වර්ධනය කරන්නාවූ ප්‍රධාන පර්යේෂණ සංඝටකයක්ද ඇතුළත් වේ.

Website : www.cpalanka.org
Facebook : www.facebook.com/cpasl
Twitter : www.twitter.com/cpast